කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022**

**2025 ජූලි**

**සමාජීය විද්‍යා පීඨය**

## පුස්තකාල හා විඥාපන විද්‍යාව
(නව නිර්දේශය)

## විමර්ශන සේවා, තොරතුරු සේවා සහ පුස්තකාල කළමනාකරණය
## LISC 38214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පාඨක ප්‍රජාව විසින් විමර්ශන අංශයකට ඉදිරිපත් කරන විමර්ශන ප්‍රශ්න වර්ගීකරණයකට ලක්කර ඒවා නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 20)

02. සාම්ප්‍රදායික විමර්ශන සේවාවට වඩා විද්‍යුත් විමර්ශන සේවාවෙන් පාඨක ප්‍රජාවට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

03. පසුබිම් ප්‍රශ්නවලට පිළිතුරු දීමේ කාර්යයේ දී විශ්වකෝෂ සතු භූමිකාව පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීමට ඇති එක් බාධකයක් වන්නේ භූගෝල විද්‍යාත්මක මූලාශ්‍රවල දුර්වලතාවයයි. නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

05. "ඕනෑම පුස්තකාලයක පැවැත්ම කෙරෙහි බලපානු ලබන ප්‍රබලතම සාධකයකි පුස්තකාල කමිටුව" මෙම ප්‍රකාශය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

06. පුස්තකාලයාධිපතිවරයෙකු සතු කළමනාකරණ මූලධර්ම පිළිබඳ දැනුම, සාර්ථක පුස්තකාල සේවාවක් සැපයීම සඳහා ඉවහල් වන අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. "පුස්තකාලයෙහි මානව සම්පත මනාව කළමනාකරණය කිරීම ගුණාත්මක හා ඵලදායී පුස්තකාල සේවාවක් සැපයීමේදී අත්‍යවශ්‍ය සාධකයකි." සාකච්ඡා කරන්න. (ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    i. සිංහල විශ්වකෝෂය
    ii. රජයේ ගැසට් පත්‍රය
    iii. විමර්ශන ග්‍රන්ථයක නවතාවය
    iv. යුරෝපා වාර්ෂික ග්‍රන්ථ
    v. පුස්තකාල වාර්ෂික වාර්තාව (ලකුණු 05 x 4=20)

*****************************